(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

**අංක 1(6).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 සැප්තැම්බර් 21 බදාදා**

---

**2022 ඔක්තෝබර් 03 සඳුදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා ඉල්ලුම්කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ අතරින් ද්විත්ව පුරවැසිභාවය ලබා දී ඇති සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව ව ෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ද්විත්ව පුරවැසිභාවය සඳහා ඉල්ලුම් කරන ලද දිනයේ සිට එය ලබා දීම දක්වා වන ක්‍රියාවලිය සඳහා නිශ්චිත කාලයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2021 දක්වා කාලය තුළ විදේශයන්හිදී සිදු වූ අනතුරු හේතුවෙන් තාවකාලික අකර්මණ්‍යතාවයට පත් වූ, පූර්ණ අකර්මණ්‍යතාවයට පත් වූ සහ මරණයට පත් වූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන් වෙනුවෙන් රජය ලබා දී ඇති සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් පරිදි විදේශයන්හි සේවයේ යෙදී සිටියදී පූර්ණ අකර්මණ්‍යතාවයට ලක්වන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා නොමිලේ නිවසක් ඉදිකර දීමේ හෝ ඔවුන්ගේ කැමැත්ත පරිදි ඊට සමාන ප්‍රතිලාභයක් ලබා දීමේ වැඩසටහනක් මේ වනවිට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය විසින් ආරම්භ කර තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

29/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උපකාරක පන්ති පවත්වනු ලබන ආයතනවල ප්‍රමිතිය නියාමනය කිරීම සඳහා රජයේ ආයතනයක් තිබේද;

(ii) එසේ නම්, එම ආයතනයේ නම කවරේද;

(iii) එම ආයතනයේ කාර්යභාරය කවරේද;

(iv) එවැනි ආයතනයක් ස්ථාපිත කර නොමැති නම්, ඒ සඳහා ආයතනයක් ස්ථාපිත කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

30/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ පවතින විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය හේතුවෙන් ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් දැඩි පීඩාවට පත් වන බවත්;

(ii) ඒ හේතුවෙන් ඔවුන්ගේ නිර්මාණශීලිත්වයට සහ පෞරුෂත්ව වර්ධනයට බාධා සිදු වන බවත්;

(iii) පවතින දැඩි තරඟකාරී හා වෙහෙසකර අධ්‍යාපන ක්‍රමය වෙනස් විය යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) එම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කරනු ලබන දින වකවානු කවරේද;

(iv) එම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(v) එම මුදලින් පාසල් පද්ධතියේ භෞතික සංවර්ධනයට හා මානව සම්පත් සංවර්ධනයට වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

294/2022

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහනුවර ගුඩ් ෂෙඩ් බස් නැවතුම්පළ නවීකරණයට අදාළ වැඩ කටයුතු අවසන් කරනු ලබන දිනය කවරේද;

(ii) එම බස් නැවතුම්පළ නවීකරණය සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) ගුඩ් ෂෙඩ් බස් නැවතුම්පළ නවීකරණයට සමගාමීව මහනුවර දුම්රිය ස්ථානයත් නවීකරණය කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහනුවර ගිනි නිවන හමුදා ප්‍රධාන කාර්යාලය අසල උමං මාර්ගයක් ඉදි කිරීමට තීරණය කර තිබේද;

(ii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iii) එම උමං මාර්ගය ඉදිකිරීමට අදාළව පරිසර වාර්තාවක් ලබා ගෙන තිබේද;

(iv) ඒ සම්බන්ධයෙන් පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණයක් ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

297/2022

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිළිමතලාව සිට නානුඔය දක්වා දිවෙන ඇළ මාර්ගය වාරි ඇළ මාර්ගයක් වන්නේද;

(ii) නොඑසේ නම්, එය කවර වර්ගයේ ඇළ මාර්ගයකට අයත් වන්නේද;

(iii) ඇළ දෙපස ඉවුරු කඩා වැටීම හේතුවෙන් එම ඇළ මාර්ගය අවහිර වී ඇති බව දන්නේද;

(iv) ඇළ ඉවුරු ක්‍රමවත්ව සකස් කර එම ඇළ මාර්ගය පිරිසිදු කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

343/2022

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අධ්‍යාපන විද්‍යා පීඨවලින් පිටවන ගුරුවරුන්ගෙන් විශාල කාර්යභාරයක් සිදු වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති අධ්‍යාපන විද්‍යා පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) පසුගිය වර්ෂ පහ තුළදී එම එක් එක් විද්‍යා පීඨයෙන් පාඨමාලා හදාරා පිට වූ ගුරුවරුන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අධ්‍යාපන විද්‍යා පීඨවල පාඨමාලා හැදෑරීම සඳහා තෝරා ගනු ලබන ශිෂ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව වැඩි කිරීමට වැඩපිළිවෙළක් තිබේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

344/2022

ගරු හේෂා විතානගේ මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "නෙළුම් කුලුන" ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කරන ලද දිනය කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතියේ අරමුණු කවරේද;

(v) “නෙළුම් කුලුන” නැරඹීම සඳහා ජනතාවට විවෘත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) “නෙළුම් කුලුන” ව්‍යාපෘතියේ මේ වනවිට සිදු කර ඇති ආයෝජන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයෝජනවල නම් කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා එම එම ව්‍යාපෘතිය යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

675/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා ලබා දී ඇති ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් බලපත්‍රලාභියාගේ නම හා ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම බලපත්‍ර ලබා දීම මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව උපයන ලද ආදායම කොපමණද;

(iv) ඉන්ධන පිරවුම්හල් සඳහා බලපත්‍ර ලබා දීමේදී සලකා බලනු ලබන නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

677/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති මහා පරිමාණ සහල් මෝල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් සහල් මෝල් හිමියාගේ නම හා ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් දැඩි මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දී සිටින බව දන්නේද;

(iii) එසේ නම්, සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් නගාසිටුවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

968/2022

ගරු ශානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ගණකාධිකාරිවරයකු පත් කර තිබේද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ගණකාධිකාරිවරයකු පත් කිරීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවුර්පත්තු, කලවාන්චිකුඩි සහ පෝරතිවුපත්තු යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනේ ජනගහනය අධික බැවින් එම එක් එක් කොට්ඨාසය කොටස් දෙකකට බෙදීම සඳහා මේ වනවිට පියවර ගෙන තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

969/2022

ගරු ශානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති තෘණ භූමි සංඛ්‍යාව කොපමණද;

(ii) නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරවරයා විසින් එම තෘණ භූමිවල ගොවිතැන් කිරීම සඳහා අවසර ලබා දී තිබෙන බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නැගෙනහිර පළාතේ දියර කිරි නිෂ්පාදනය, ශ්‍රී ලංකාවේ මුළු දියර කිරි නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

(ii) දියර කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1108/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "යහපාලන රජය" සමයේ සිදු වූ බැඳුම්කර වංචාවට ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ගේ ද සම්බන්ධයක් පැවති බව දන්නේද;

(ii) බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් කරන ලද විමර්ශනවලදී එම වංචාවට සම්බන්ධ බවට අනාවරණය වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ගේ නම් කවරේද;

(iii) එම නිලධාරීන්ට එරෙහිව මේ දක්වා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1109/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "යහපාලන රජය" සමයේ ආරක්ෂක මණ්ඩල රැස්වීම් පැවති දින ගණන කොපමණද;

(ii) එම රැස්වීම් සඳහා එවකට සිටි අග්‍රාමාත්‍යවරයා සහභාගි වූ දින ගණන හා සහභාගි නොවූ දින ගණන වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2019 වර්ෂයේ සිදු වූ පාස්කු ප්‍රහාරයට සම්බන්ධ බවට චෝදනා ලැබූ දේශපාලනඥයන්ගේ, ආරක්ෂක අංශවල නිලධාරින්ගේ සහ පරිපාලන නිලධාරින්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ප්‍රහාරය සම්බන්ධයෙන් මේ දක්වා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1515/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ වී ගොවිතැන් සිදු කරනු ලබන කුඹුරු අක්කර ප්‍රමාණය සහ වී ගොවිතැන් සිදු කරනු ලබන ගොවි පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(ii) වර්ෂ 2015 සිට 2019 දක්වා වී ගොවිතැනෙන් ඉවත් වූ පවුල් සංඛ්‍යාව;

(iii) එම කාලය තුළ වී ගොවීන් සඳහා පොහොර සහනාධාරය ලබා දීමට වැය කරන ලද මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ මුළු පොහොර අවශ්‍යතාවය එක් එක් බෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2020 වර්ෂයේ රසායනික පොහොර ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල හා ආනයනය කරන ලද පොහොර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1516/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්ථිර නිවාස නොමැති පවුල් සංඛ්‍යාව;

(ii) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ස්ථාපිත කරන ලද දිනයේ සිට එම අධිකාරිය විසින් මේ දක්වා ඉදිකර ඇති, ආධාර ලබා දී ඇති සහ ණය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(iii) වර්ෂ 2015 සිට 2019 දක්වා එම අධිකාරිය විසින් ඉදිකර ඇති සහ ආධාර ලබා දී ඇති නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(iv) එම කාලය තුළදී ඉදිකරන ලද නිවාස ව්‍යාපෘති විවෘත කිරීමේදී, ඒවායේ ප්‍රචාරණ වියදම් සඳහා වැය කරන ලද මුදල;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1528/2022

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ අලි-මිනිස් ගැටුම් හේතුවෙන් මරණයට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ මරණයට පත්වන එක් පුද්ගලයෙකු වෙනුවෙන් ගෙවනු ලබන වන්දි මුදල කොපමණද;

(iii) අලි-මිනිස් ගැටුම් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1529/2022

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම පාසල්වල උගන්වනු ලබන එක් එක් විෂයට අදාළව —

(i) අනුමත ගුරුවරුන් සංඛ්‍යාව;

(ii) මේ වනවිට සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව;

(iii) මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (ආ) (iii) හි සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1674/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ ගම්මාන අතරින් පානීය ජල ගැටලුව පවතින ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) මාතලේ දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1897/2022

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා එක් එක් වර්ෂය අනුව ලංකා විදුලිබල මණ්ඩලය ලැබූ ලාභය/අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්තමානයේ පවතින විදුලි ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දීමට නොහැකි වීම හේතුවෙන් පෞද්ගලික අංශයෙන් විදුලිය මිලදී ගැනීමට තීරණය කර තිබේද;

(iii) එසේ නම්, එම තීරණය හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයට දැරීමට සිදුවන අතිරේක වියදම කොපමණද;

(iv) හදිසි විදුලි මිලදී ගැනීම් හැකිතාක් අවම කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2002/2022

ගරු ජේ.සී. අලවතුවල මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය ජනාධිපතිවරණයේදී සහ පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී පොරොන්දු වූ පරිදි, ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සකස් කර ඇති වැඩපිළිවෙළ ගුරුවරුන් සහ විදුහල්පතිවරුන්ට අදාළ වන පරිදි වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීමේදී ඔවුන්ට අදාළ හිඟ වැටුප් ගෙවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2043/2022

ගරු වේලු කුමාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයෙන් පසු ජාතික පාසල් බවට පත් කරන ලද මහනුවර දිස්ත්‍රික්කයේ පළාත් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, සිංහල මාධ්‍ය පාසල් සහ දෙමළ මාධ්‍ය පාසල් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාතික පාසල් ප්‍රමිතීන්ට අනුව ජාතික පාසලක තිබිය යුතු බිම් ප්‍රමාණය, ශිෂ්‍ය සංඛ්‍යාව සහ ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත (අ) (i)හි සඳහන් ජාතික පාසල් එම ප්‍රමිතීන්ට අනුකූල වන්නේද;

(iii) නොඑසේ නම්, එම පාසල්, ජාතික පාසල් බවට පත් කිරීමේ පදනම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2063/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ඉදිකරමින් පවතින කණ්ඩු මත දිවෙන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ඇස්තමේන්තු මුදල කොපමණද;

(ii) එම මාර්ගයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) ඒ සඳහා අරමුදල් සපයා ගනු ලැබූ ක්‍රමවේදය කවරේද;

(iv) ඒ සඳහා අරමුදල් සපයන ලද ආයතන කවරේද;

(v) එම මාර්ගයේ ඉදිකිරීම් අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2172/2022

ගරු රෝහණ බංඩාර මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම් සහ ණයදෙන සමිතිය සඳහා අත් පත්‍රිකා මුද්‍රණය කිරීමට මිල ගණන් කැඳවන ලද දිනය කවරේද;

(ii) ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ආයතනයේ නම හා ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් ආයතනය විසින් අත් පත්‍රිකාවක් මුද්‍රණය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ටෙන්ඩරය පානදුර, "සසුර ප්‍රින්ටර්ස්" වෙත ලබා දී ඇති බවත්;

(ii) ඒ සම්බන්ධයෙන් විශාල විරෝධයක් එල්ල වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2520/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ බුලත් නිෂ්පාදනය;

(ii) බුලත් අපනයනයෙන් ලැබූ ආදායම;

වර්ෂ 2015 සිට මේ දක්වා එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ බුලත් වගාව සිදු කරනු ලබන ප්‍රදේශ කවරේද;

(ii) බුලත් වගාව තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2537/2022

ගරු මධුර විතානගේ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා තේ ශක්ති අරමුදලේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2553/2022

ගරු කුමාරසිරි රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා අධ්‍යාපන කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2564/2022

ගරු සංජීව එදිරිමාන්න මහතා,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 වර්ෂය වනවිට සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලේ ප්‍රතිලාභින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අරමුදලේ ඇති මුදල් ආයෝජනය කර ඇති මූලාශ්‍ර කවරේද;

(iii) එම ආයෝජන වලින් උපයා ඇති ලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා 'ශ්‍රම සුව රැකවරණ' වැඩසටහනේ ප්‍රතිලාභින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රතිලාභින් සඳහා වැය කර ඇති සම්පූර්ණ මුදල කොපමණද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා එම ප්‍රතිලාභ ලබන පවුල්වල ශිෂ්‍යත්වලාභින් වෙනුවෙන් වැය කර ඇති සම්පූර්ණ මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2885/2022

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වැවිලි සමාගම්වලට අයත් වතු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වතුවල වගා කර ඇති බෝග වර්ග කවරේද;

(iii) එම එක් එක් බෝගයේ වාර්ෂික ඵලදාව කොපමණද;

(iv) ඉහත එක් එක් වතු සමාගමේ වාර්ෂික ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2582/2022

ගරු ලලිත් වර්ණ කුමාර මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති සමථ මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමථ මණ්ඩල තුළින් මේ දක්වා සමථයට පත්කර ඇති ආරවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) වර්තමානයේදී සමථ මණ්ඩල ක්‍රමය අමාත්‍යාංශය විසින් අධීක්ෂණය කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමථ මණ්ඩල නිලධාරින්ගේ සේවය ඇගයීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) සමථ මණ්ඩල ක්‍රියාදාමය කාලීනව ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2586/2022

ගරු තිස්ස අත්තනායක මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුම්රිය මගීන්ගේ පහසුකම් පුළුල් කිරීමේ අරමුණින් දුම්රිය ස්ථාන නවීකරණය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය යටතේ නවීකරණය කරනු ලබන එක් එක් දුම්රිය ස්ථානය, එම දුම්රිය ස්ථානය පිහිටි දිස්ත්‍රික්කය, එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුදල, එම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමට අපේක්ෂිත කාල වකවානුව, ව්‍යාපෘති සැලසුමට අනුව අන්තර්ගත වන වැඩ සැලැස්ම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2601/2022

ගරු අශෝක් අබේසිංහ මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2022 දක්වා ශ්‍රී ලංකාව ලබාගත් විදේශීය සහ දේශීය ණය ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් ණය ලබාගෙන ඇති ආයතනය/රට වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් ණය සඳහා ගෙවනු ලබන වාරිකය සහ පොළිය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2623/2022

ගරු ඩී. වීරසිංහ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිතුල් ආශ්‍රිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කිතුල් සංවර්ධන මණ්ඩලය විසින් මේ වනවිට හඳුනාගෙන ඇති ප්‍රදේශ කවරේද;

(ii) එම ප්‍රදේශවල කිතුල් ආශ්‍රිත නිෂ්පාදන සිදුකරන්නේද;

(iii) ඉදිරියේදී කිතුල් ආශ්‍රිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර ඇති ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා අපනයනය කර ඇති කිතුල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණය කොපමණද;

(ii) එමඟින් ලැබූ අපනයනය ආදායම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2631/2022

ගරු සම්පත් අතුකෝරළ මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2018 සිට මේ දක්වා සංචාරක ව්‍යාපාරය තුළ ඍජු සහ වක්‍ර රැකියාවල නියුතු පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කොවිඩ්-19 වසංගතය හේතුවෙන් එම පුද්ගලයන්ගේ රැකියා සම්බන්ධයෙන් දැඩි අවිනිශ්චිත තත්ත්වයක් ඇති වී තිබෙන බව දන්නේද;

(iii) ඔවුන්ට සහන ලබා දීම සඳහා ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2641/2022

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කර්මාන්තශාලාවලින් සහ වෙනත් ඉදිකිරීම්වලින් බහුල වශයෙන් ගංගාවලට අපද්‍රව්‍ය බැහැර කරන බවත්;

(ii) සමහර ඉදිකිරීම් සඳහා නිසි අධ්‍යනයකින් තොරව පරිසර බලපත්‍ර නිකුත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගංගාවලට අපද්‍රව්‍ය බැහැර කරන කර්මාන්තශාලා/ආයතන දැනුම්වත් කර එලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම වැළැක්වීමට පියවර ගන්නේද;

(ii) ගංගාවලට අපද්‍රව්‍ය බැහැර කරන බවට මේ වනවිට හඳුනාගෙන ඇති කර්මාන්තශාලා/ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) එම කර්මාන්තශාලා/ආයතනවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2647/2022

ගරු ගාමිණී වලේබොඩ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මන්නාරම් ද්‍රෝණියේ බලශක්ති නිධියක් පවතින බවත්;

(ii) විවිධ විදේශීය සමාගම් සමඟ ඒකාබද්ධව ශ්‍රී ලංකා රජය විසින් බලශක්ති නිධි සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කරනු ලබන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පර්යේෂණවල අවසන් නිගමනය කවරේද;

(ii) බලශක්ති නිධි පවතී නම්, කැණීම් සිදු කර, ඒවා භාවිතයට ගැනීම සඳහා පවතින බාධා කවරේද;

(iii) කැණීම් සිදු කිරීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(iv) මන්නාරම් ද්‍රෝණියේ බලශක්ති නිධි සම්බන්ධයෙන් පර්යේෂණ කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා වර්තමානයේ ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2650/2022

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සහ එක් එක් පළාත් සභාවේ ලියාපදිංචි වී ඇති සංචාරක රියදුරන් සහ සංචාරක මඟ පෙන්වන්නන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඔවුන්ගේ ආදායම් මාර්ග බිඳ වැටී ඇති බව දන්නේද;

(iii) එසේ නම්, ඔවුන්ට සහන සැලසීම වෙනුවෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2660/2022

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ඇති ධීවර වරාය සහ නැංගුරම්පළ සංඛ්‍යාව;

(ii) මේ වනවිට ඉදිකරමින් පවතින සහ ඉදිරියේදී ඉදිකිරීමට සැලසුම්කර ඇති නැංගුරම්පළ සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ධීවර මෙවලම් සහ උපකරණ සහන මිලට අලෙවි කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

(ii) ධීවර වරාය සහ නැංගුරම්පළ මාර්ගයෙන් අඛණ්ඩව ඉන්ධන ලබා දීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

(iii) ධීවර සමූපකාර සමිතිවල වර්තමාන ක්‍රියාකාරිත්වය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2691/2022

ගරු වාසුදේව නානායක්කාර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූර්ය පියසි පැනල මඟින් විදුලිබලය නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් මීට මාස 6කට පමණ පෙර ඩෙන්මාර්ක් රජය විසින් අර්පණයක් ඉදිරිපත් කරනු ලැබුවේද;

(ii) එම අර්පණය සම්බන්ධයෙන් මේ වනතෙක් ඉදිරි ක්‍රියාමාර්ග නොගැනීමට හේතු කවරේද;

(iii) එම අර්පණය සම්බන්ධයෙන් ගැනීමට අපේක්ෂිත ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2724/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ස් (Central Investment and Finance PLC -CIFL) නමින් වූ මූල්‍ය ආයතනයක් සඳහා ව්‍යාපාරික කටයුතු සිදු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසරයක් ලබා දී තිබුණේද;

(ii) එම ආයතනය විසින් සිය තැන්පත්කරුවන්ගේ මුදල් නැවත ඔවුන්ට ගෙවා නොමැති බව දන්නේද;

(iii) එම ආයතනය බුන්වත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරීක්ෂණයක් සිදු කරනු ලැබුවේද;

(iv) එම පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) ඉහත තැන්පත්කරුවන්ගේ මුදල් නැවත ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2980/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වනාන්තර ඉඩම්, බදු පදනම මත සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘති කවරේද;

(iii) එම ඉඩම් දේශීය ආයෝජකයන් සඳහා බදු දී තිබේද ;

(iv) නොඑසේ නම්, විදේශීය ආයෝජකයන් සඳහා බදු දී තිබේද;

(v) එම ඉඩම් බදු දෙන ලද ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3085/2022

ගරු තිසකුට්ටි ආරච්චි මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ ශාඛා සංඛ්‍යාව කොපමණද ;

(ii) එම ආයතනය මඟින් වර්ෂයකට වෛද්‍ය පරීක්ෂණවලට භාජනය කරනු ලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) බර වාහන රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමේදී සහ සැහැල්ලු වාහන රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමේදී අවශ්‍ය වන වෛද්‍ය සහතික වෙනුවෙන් අය කරනු ලබන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3116/2022

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අලි-මිනිස් ගැටුමට සෘජුවම හේතු වන කරුණු කවරේද;

(ii) අලි-මිනිස් ගැටුම විසඳීම සඳහා රාජ්‍ය නොවන පරිසර සංවිධාන විසින් යෝජනා ඉදිරිපත් කර තිබේද;

(iii) එම යෝජනා සමාලෝචනය කර ඒ සම්බන්ධයෙන් වාර්තා සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වන අලින් සඳහා අවශ්‍ය ආහාර හිඟ වීම හේතුවෙන් වන අලින් ගම්මානවලට පැමිණෙන බව පිළිගන්නේද;

(ii) වන අලින් සඳහා අවශ්‍ය ආහාර වනාන්තර තුළින්ම සැපයීමට වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3147/2022

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කොහු මෝල් හිමියන් සංඛ්‍යාව කොපමණද;

(ii) විදුලි ගාස්තු වැඩිවීම හේතුවෙන් කොහු මෝල් කර්මාන්තයට දැඩි අහිතකර බලපෑමක් එල්ල වී ඇති බව දන්නේද;

(iii) ඒ හේතුවෙන් අහිමි වන සෘජු හා වක්‍ර රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) කොහු මෝල් හිමියන් ආරක්ෂා කිරීම සඳහා කොහු මෝල්වල විදුලි ගාස්තු සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) කොහු ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමෙන් උපයනු ලබන වාර්ෂික අදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3148/2022

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක් හවුස්) ආයතනය ස්ථාපිත කර ඇති ඉඩම සහ එම ගොඩනැගිල්ල වෙනත් ව්‍යාපෘතියක් සඳහා පැවරීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එම තීරණය ඉහත සඳහන් ආයතනයේ ඉදිරි පැවැත්ම සඳහා බලපානු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3149/2022

ගරු මයන්ත දිසානායක මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර, පේරාදෙණිය සහ පිළිමතලාව යන නගරවල පවතින අධික වාහන තදබදය අවම කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iv) එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3150/2022

ගරු ලලිත් එල්ලාවල මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "වාරි සෞභාග්‍යා" වැඩසටහන යටතේ බණ්ඩාරගම ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් වෑවිට වැව, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ රොන්මඩ ඉවත්කර සංවර්ධනය කිරීම 2021.02.07 දින ආරම්භ කරන ලද බවත්;

(ii) මේ වනවිට එම සංවර්ධන කටයුතු නවතා දමා ඇති බවත්;

(iii) ඒ හේතුවෙන් එම ප්‍රදේශයේ ගොවීන් අසීරුතාවයකට පත් වී ඇති බවත්;

(iv) එම වැව දෙපස වැව් බැම්, මාර්ගයට හානි වන පරිදි කැපීම හේතුවෙන් වෑවිට මෛත්‍රී මහා විදුහල පැත්තෙන් ඉතා අනතුරුදායක තත්ත්වයක් ඇති වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(ii) වැවෙහි සංවර්ධන කටයුතු ක්‍රමවත්ව සිදු නොකිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරින්ට එරෙහිව ගනු ලබන පියවර කවරේද;

(iii) සංවර්ධන කටයුතු අවසන් කර එය ප්‍රදේශයේ ගොවීන්ගේ කුඹුරු අස්වැද්දවීම සඳහා භාවිතා කිරීමට ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3151/2022

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ නිරන්තරයෙන් ජලගැලීම් හා නායයෑම් සිදුවන බව දන්නේද;

(ii) ඒවා පාලනය කිරීම/අවම කිරීම සඳහා මේ වනවිට වැඩසටහන් සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3152/2022

ගරු මිලාන් ජයතිලක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 වර්ෂය සඳහා අවශ්‍ය කරන පාසල් පෙළ පොත් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෙළ පොත් මේ වනවිට මුද්‍රණය කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2023 වර්ෂය සඳහා පාසල් නිල ඇඳුම් ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම නිල ඇඳුම් සඳහා වැය වන මුදල කොපමණද;

(iii) 2023 වර්ෂය සඳහා අවශ්‍ය පාසල් නිල ඇඳුම් අතරින් දේශීය වශයෙන් හා විදේශීය වශයෙන් මිලදී ගනු ලබන ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3153/2022

ගරු සුදත් මංජුල මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ රබර් වගා කර ඇති මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතරින්, රජය සතු ඉඩම් ප්‍රමාණය සහ පෞද්ගලික අංශය සතු ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කෑගල්ල දිස්ත්‍රික්කයේ රබර් වගාව ව්‍යාප්ත කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2022 ඔක්තෝබර් 04 අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1525/2022

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉපලෝගම පොලිස් ස්ථානය පවත්වාගෙන යාම සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් නොමැතිවීම හේතුවෙන් මේ වනවිට එම පොලිස් ස්ථානය පවත්වාගෙන යාම සඳහා "රණජයපුර" නිවාස සංකීර්ණයට අයත් නිවාස භාවිතා කරනු ලබන බවත්;

(ii) මෙම පොලිස් ස්ථානයට අදාළ බලප්‍රදේශය සඳහා ග්‍රාම නිලධාරි වසම් 33ක් අයත් වන බවත්;

(iii) එම පොලිස් ස්ථානයට ලබාදී ඇති නිල රථය භාවිතා කිරීමට නුසුදුසු තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පොලිස් ස්ථානය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) පොලිස් ස්ථානයේ භාවිතය සඳහා නව නිල රථයක් ලබා දීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?